**ජාතික මාර්ග ජාලයේ ප්‍රධාන පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය (ප්‍රධාන පාලම් 37 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය) 2019.**

---

ජාතික මාර්ග ජාලයේ ප්‍රධාන පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ (ප්‍රධාන පාලම් 37 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය) 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය අතර 2013 මාර්තු 14 දින එළඹි අංක එස්එල්-පී 108 දරන ණය ගිවිසුමේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකනු ලබන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ජාතික මාර්ගවල ප්‍රධාන පාලම් ඉදිකිරීම මඟින් ජාතික මාර්ග ජාලය වැඩි දියුණු කිරීම හා එමඟින් ආර්ථික සංවර්ධනයට දායක වීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ.ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 27,250 කට සමාන ජපන් යෙන් මිලියන 16,132 ක් වන අතර එම මුදලින් රු.මිලියන 20,914 කට සමාන ජපන් යෙන් මිලියන 12,381 ක් සැපයීමට ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය එකඟ වී තිබුණි. ශ්‍රී ලංකා රජය විසින් ජපන් යෙන් මිලියන 3,751 ක් වන ඉතිරි මුදල මූල්‍යයනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2013 මාර්තු මස ආරම්භ කළ අතර 2019 වර්ෂයේදී අවසන් කිරීමට නියමිතය. ණය උපයෝජනයේ කල්ඉකුත්වීම 2021 ජුනි 05 දින අවසන් කිරීමට නියමිත වූ අතර ණය දීර්ඝ කිරීමට අවසරදීමට ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය අපේක්ෂා නොකරයි. ප්‍රතිඵලයක් ලෙස, මුළු ණය වටිනාකමින් සියයට 37 ක් හෙවත් රු.මිලියන 7,760 කට සමාන ජපන් යෙන් මිලියන 4,595 ක් ව්‍යාපෘතියේ විෂය පථයේ වූ ඉතිරි වැඩ සඳහා භාවිතයට ගැනීමට නොහැකි වේ.

**1.3 තත්වාගණනය කළ මතය**

---

මාගේ මතය, මෙම වාර්තාවේ 2 වගුවෙන් විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනයන් තුළින් 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බවයි.

**1.4 මතය සඳහා පදනම**

---

මම මාගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුව සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම ,මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා යෝග්‍ය බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම**

---

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන් වලට අනුකූලව පිළියෙල කිරීම, සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ව්‍යාපෘතිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම පිළිබඳව වගකීම ඊට සම්බන්ධ පාර්ශවය විසින් දරනු ලබයි.

ව්‍යාපෘතිය විසින් වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය සියලු ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීම සම්බන්ධව විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හෝ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී ඒ සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හෝ වැරදි තනිව හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය හා වෘත්තීය සැකයෙන් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් හා ක්‍රියාත්මක කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනානොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම් වල සාධාරණත්වය ඇගයීම.

- හෙලිදරව් කිරීම් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනයේදී මා හඳුනාගන්නා අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු අඩුපාඩුද ඇතුළුව සැලකිය යුතු විගණන සොයාගැනීම් හා අනෙකුත් කරුණු සම්බන්ධයෙන් ඊට සම්බන්ධ පාර්ශවයන් සමඟ මම සන්නිවේදනය කරමි.

## 2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස්

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | ගිණුම්කරණ අඩුපාඩු | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතිය මඟින් රු.මිලියන 44.83 ක පිරිවැයකට මෝටර් රථ 05 ක් මිලදී ගෙන තිබුණද දේපළ පිරියත හා උපකරණ යටතේ එකතුව රු.මිලියන 40 ක් පමණක් වාර්තා කර තිබූ අතර ඉතිරි රු.මිලියන 4.83 රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 අනුව ප්‍රාග්ධනිත කිරීම සිදු නොකර සිවිල් කෙරීගෙන යන වැඩ ගිණුමේ වාර්තා කර තිබුණි. | මෝටර් රථ ගිණුමේ පිරිවැය අඩුවෙන් දැක්වීම. | එකඟ වේ. නිවැරදි කිරීමට ක්‍රියාමාර්ග ගනු ලැබේ. | මෝටර් රථ 05 හි පිරිවැය නිවැරදිව හඳුනාගෙන දේපළ පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කල යුතුය. |
| (ආ) | මාර්ග සංවර්ධන අධිකාරියෙන් රු.මිලියන 7.32 ක ණයක් ලැබීම හේතුවෙන් උද්ගතව මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා ඇති ජංගම නොවන වගකීම, මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ජාතික ඉතිරි කිරීමේ බැංකුවට ණය නිරවුල් කිරීම පිළිබඳව සාක්ෂි ලබා නොගෙන සමාලෝචිත වර්ෂය තුල කපාහැර තිබුණි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති වැරදි ලෙස භාවිතා කිරීම. | එකඟ වේ. මෙය ප්‍රමාද දෝෂයක් නිසා වන අතර දැන් නිවැරදි කර ඇත. | සාක්ෂි ලබා නොගෙන මූල්‍ය ප්‍රකාශන සඳහා ගැලපීම් නොකළ යුතුය. |

3 කොන්ත්‍රාත් පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| අංක | විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | 2013 මාර්තු14 දින එළඹි ණය ගිවිසුමට අනුව, රු.මිලියන 20,914 කට සමාන ජපන් යෙන් මිලියන 12,381 ක මුළු ණය පහසුකමක් ව්‍යාපෘතියට තිබුණ අතර 2021 ජුනි 05 දිනෙන් ණය කාලය ඉකුත් වේ. කෙසේවෙතත්, ව්‍යාපෘතිය මුළු ණය පහසුකමින් රු.මිලියන 10,373 කට සමාන ජපාන යෙන් මිලියන 7,794 ක් 2019 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කර තිබුණි. ඒ අනුව, ව්‍යාපෘතියට ව්‍යාපෘති කාලසීමාව තුළ රු.මිලියන 7,760 කට සමාන ජපාන යෙන් මිලියන 4,595 ක් උපයෝජනය කිරීමට නොහැකි විය. තවද, ණය දෙන ආයතනය විසින් ණය අවසන් දිනය තවදුරටත් දීර්ඝ කර නොමැති බව නිරීක්ෂණය විය. කොන්ත්‍රාත් ප්‍රදානය සහ පාලම්වල ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් මුළු ණය පහසුකමින් සියයට 37 ක් නියෝජනය වන ජපාන යෙන් මිලියන 4,595 ක් ව්‍යාපෘතියේ පාලම් ඉදිකිරීමේ කටයුතු සඳහා උපයෝජනය නොකර ණය දෙන ආයතන වෙත ආපසු යැවිය යුතුව තිබුණි. | අරමුදල් හිඟකම හේතුවෙන් ව්‍යාපෘතියේ ඉතිරි වැඩ සම්පූර්ණ කිරීමට නොහැකි වීම. | සිවිල් වැඩ සඳහා යෙන් මිලියන 10,289 ක් පමණක් වෙන්කර ඇත. පැකේජ 01 හා 02 හි ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත් වටිනාකම යෙන් මිලියන 8,890 කි. එමනිසා, භාවිතා කල ප්‍රතිශතය සියයට 86.4 කි. යෙන් මිලියන 1,399 ක ශේෂයක් ඊළඟ පැකේජ සඳහා තිබෙන අතර පැකේජ 01 සහ 02 හි කොන්ත්‍රාත් වටිනාකම් සසඳන විට එය පාලම් 03 ක් සඳහා පමණක් ප්‍රමාණවත් වේ. | ව්‍යාපෘති කාල සීමව තුළ විෂය පථයේ වූ වැඩ සම්පූර්ණ කිරීමට හැකිවන ලෙස පාලම් ඉදිකිරීම් කටයුතු නිසි පරිදි සැලසුම් කිරීම අවශ්‍ය වේ. |
| (ආ) | ව්‍යාපෘතිය කොන්ත්‍රාත් පැකේජ 05 ක් යටතේ දකුණ, උතුර, වයඹ, සබරගමුව සහ බස්නාහිර පළාත්වල ජාතික මාර්ග 19 ක නව පාලම් 37 ක් ඉදිකිරීමට අපේක්ෂිතය. දකුණු පළාතේ පාලම් 10 ක ඉදිකිරීම් කටයුතු අතරින් පාලම් 08 ක් 2018 දෙසැම්බර් 31 දින වන විට අවසන් කර තිබුණි. 2015 මාර්තු 20 | පාලම් ඉදිකිරීමේ කටයුතු අවසන් කිරීම ප්‍රමාද වී තිබූ අතර ව්‍යාපෘතියේ පිරිවැය ඉහළයාම. | සැලසුම් කිරීමේ අදියරේදී, දේශීය වටිනාකම් භාවිතා කරමින් මාර්ග සංවර්ධන අධිකාරියේ පාලම් සැලසුම් කාර්යාලය විසින් සකස් කල | මූලික සැලැස්මට අනුව, පාලම් නැවත ඉදිකිරීමේ කටයුතු ණය කාල සීමාව ඉකුත්වීමට පෙර සම්පූර්ණ කිරීම සඳහා පළමු වසර 02 තුළ ආරම්භ කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | දින ආරම්භ කරන ලද පොල්වතුමෝදර සහ ගොවියාපානෙහි පාලම් 02 ක ඉදිකිරීම් කටයුතු වැඩබිම් භාරදීම ප්‍රමාද වීම, අතිරේක වැඩ සහ උපයෝගී සේවා විතැන්කිරීමේ දී ප්‍රමාද වීම යනාදිය හේතුවෙන් දින 166 සිට 438 දක්වා පරාසයක ප්‍රමාදයකින් අවසන් කර තිබුණි. 2016 නොවැම්බර් 24 දින ආරම්භ කරන ලද උතුරු පළාතේ නව පාලම් 08 ක ඉදිකිරීම් කටයුතුද 2018 දෙසැම්බර් 31 දින වන විට දින 120 කට වඩා ප්‍රමාද වී අවසන් කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ පැකේජ 01 සහ 02 හි පාලම් ඉදිකිරීමේ කටයුතු ප්‍රමාද වීම , ජපන් ලංසුකරුවන්ට පමණක් ලංසු තැබීම සඳහා සහභාගී වීමට අවසර දීම වැනි ණය කොන්දේසි හේතුවෙන් පැකේජ 03,04 සහ 05 යටතේ අනෙකුත් පළාත් 03 ක නව පාලම් 19 ක පාලම් ඉදිකිරීමේ කටයුතු අත්හැර දමා තිබුණි. | | ඇස්තමේන්තු මත පදනම්ව ප්‍රධාන පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය (ප්‍ර.පා.ඉ.ව්‍යා.) යටතේ පාලම් 37 ක් නැවත ඉදිකිරීම සඳහා හඳුනාගෙන ඇත. කෙසේවෙතත්, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අදියරේදී පහත සඳහන් හේතු නිසා ලංසු වටිනාකම් ඉහළ ගොස් ඇත.<br>I. ණය කොන්දේසි අනුව, ජපානයෙන් මිලදී ගන්නා භාණ්ඩ හා සේවා සඳහා වන මුළු පිරිවැය මුළු කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 30 කට නොඅඩු විය යුතුය.<br>II. ණය කොන්දේසි අනුව, ලංසු තැබීම සඳහා සහභාගී වීමට ජපන් ලංසුකරුවන්ට පමණක් අවසර දී ඇති බැවින් ලංසුකරුවන් අතර තරඟකාරීත්වයේ ප්‍රමාණය ඉතා අඩු වීම. | |
| (ඇ) | ලබා දී ඇති තොරතුරු අනුව, පැකේජ 01 යටතේ පාලම් ඉදිකිරීමේ කටයුතු සඳහා රජයේ ඉඩම් කැබලි | පාලම් ඉදිකිරීම අවසන් කිරීමට ප්‍රමාද වීම සහ ඉඩම් අත්පත් කර ගැනීමේ පොළී | 2015 මාර්තු මස සිවිල් වැඩ ආරම්භ කිරීම හේතුවෙන්, | ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට පෙර ඉඩම් අත්පත් කර |

| | | | | |
|---|---|---|---|---|
| | 171 ක් ඇතුළුව ඉඩම් කැබලි 317 ක් අත්පත් කර ගැනීමට සැලසුම් කර තිබූ අතර, එයින් ඉඩම් කැබලි 127 ක් සඳහා සංවර්ධන වටිනාකම ඇතුළුව රු.මිලියන 280.2 ක වන්දි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 17 වන වගන්තිය යටතේ ගෙවා තිබුණි. ඊට අමතරව, 2019 දෙසැම්බර් 31 දක්වා වන්දි ගෙවීමේ ප්‍රමාදය මත පොළී ලෙස එකතුව රු.මිලියන 36.75 ක් ගෙවා තිබුණි. ඉඩම් කැබලි 127 න්, ව්‍යාපෘතිය 1986 අංක 13 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 44 වන වගන්තිය යටතේ 2019 දෙසැම්බර් 31 දිනට ඉඩම් කැබලි 36 ක පමණක් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය අවසන් කර තිබුණි. | පිරිවැය ඉහළ යාම. | ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට විශේෂ ව්‍යාපෘති කළමණාකරන අංශය 2014/15 වර්ෂය තුල 1986 අංක 13 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38(අ) වගන්තිය අනුගමනය කර ඇත. | ගැනීමේ කටයුතු අවසන් කිරීමට පියවර ගත යුතුය. ඊට අමතරව ප්‍රමාණවත් සැලසුම්කරණය, ප්‍රගතිය ඇගයීම, වන්දි ගෙවීම් මත අධීක්ෂණ හා පාලනය අවශ්‍ය වේ. |
| (ඈ) | ව්‍යාපෘතිය පාලම් ඉදිකිරීමේ කටයුතු ආරම්භ කිරීම සඳහා අරමුදල් සම්පාදනයකින් තොරව පැකේජ 03 යටතේ ඉඩම් කැබලි 82 ක් අත්පත් කර ගැනීමත් සමඟ අඛණ්ඩව ක්‍රියාත්මක විය. වන්දි ගෙවීම ප්‍රමාද වීම හේතුවෙන් ඉඩම් අත්පත් කර ගැනීම සඳහා වන පොළී පිරිවැය ඉහළ යාමට මෙය අහිතකර ලෙස බලපානු ඇත. | ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ප්‍රමාද විය හැකි අතර ඉඩම් අත්පත් කර ගැනීම මත පොළී පිරිවැය ඉහළ යාම. | 03 වන පැකේජය සඳහා ඉඩම් අත්පත් කර ගැනීමට ගෙවීම සඳහා ශ්‍රී ලංකා රජය වෙතින් අරමුදල් ලබා ගත හැකිය. නමුත්, 2019 දෙසැම්බර් 31 දිනට ණය අඛණ්ඩව පවත්වාගෙන යාම පිළිබඳව ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතන, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා අදියරේ පවතී. 2020 මාර්තු 31 වන විට පැකේජ 03 හි ඉඩම් අත්පත් කරගැනීමේ ප්‍රගතිය සියයට 63 | ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කිරීමට පෙර අරමුදල් සම්පාදනය කර ගත යුතුය. |

කි. ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය සමඟ සියලු සාකච්ඡා අසාර්ථක බැවින් අවසාන වශයෙන් ලේකම් (මාර්ග සහ මහාමාර්ග අමාත්‍යාංශය) ණය අවසන් කිරීමේ ඉල්ලීම විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත යවා ඇත. විශේෂ ව්‍යාපෘති කළමණාකරන අංශය පැකේජ 03 හි ඉඩම් අත්පත් කර ගැනීම් තවදුරටත් කරගෙන යාම සම්බන්ධයෙන් අමාත්‍යාංශයෙන් උපදෙස් ඉල්ලා ඇත.